# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 1878/14 – 2014 සැප්තැම්බර් මස 01 වැනි සඳුදා - 2014.09.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාතේ පළාත් සභාව

**1989 අංක 06 දරන පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි**

සබරගමු පළාතේ ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන හා වතු සුභසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය මහීපාල හේරත් වන මම, අංක 1865/25 - 2014 ජුනි මස තුන්වන අඟහරුවාදා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV(අ) වැනි කොටස - පළාත් සභා නිවේදන මගින් 1989 අංක 06 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 2(2) වගන්තියේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති පී. පී. වික්‍රමසිංහ මහතා මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් කටයුතු කිරීමේදී ඉහත කී ප්‍රඥප්තියේ 2(1) වගන්තිය යටතේ දක්වනු ලබන කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා පත් කරන ලද විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු සමන් වික්‍රම වික්‍රමාරච්චි මහතාගේ පත්කිරීම ඉදිරි මාස 03ක කාලය සඳහා දීර්ඝ කරමි.

2. එසේම එකී ගැසට් නිවේදනයේ 2 හා 3 වගන්තිවලින් ප්‍රකාශයට පත් කළ විධිවිධානයන් ද ඉදිරියට එලෙසම බල පැවැත්වෙන බව නිවේදනය කරමි.

මහීපාල හේරත්,
ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර,
ප්‍රවාහන හා වතු සුභසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා
ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය,
සබරගමුව පළාත

2014 සැප්තැම්බර් මස 01 වැනි දින,
රත්නපුර, නවනගරයේ පිහිටි,
සබරගමුව පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

1A - G 019008— 10 (2014/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*